# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2019 (නව නිර්දේශය)

## 57 - නාට්‍ය හා රංගකලාව

## ප්‍රශ්නපත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

## ලකුණු දීමේ පටිපාටිය

### I පත්‍රයේ අභිමතාර්ථ

නාට්‍ය හා රංග කලාව පිළිබඳ මූලධර්ම, න්‍යාය සහ මූලික සිද්ධාන්ත පිළිබඳ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීම මෙම ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථ වේ.

මෙම ප්‍රශ්නය පත්‍රය I කොටස හා II කොටස යනුවෙන් කොටස් දෙකකින් යුක්තය.

**I පත්‍රය ලකුණු බෙදීයාම**

I කොටස - බහුවරණ ප්‍රශ්න 40 කි. නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුරට එක් ලකුණ බැගින් කෙටි ප්‍රශ්න 40 ට මුළු ලකුණු සංඛ්‍යාව 40 කි.

II කොටස - A හා B යනුවෙන් කොටස් දෙකකි. A හා B කොටස් දෙකෙන් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සැපයීම අපේක්ෂිත ය.

A හා B යන කොටස් දෙකෙහි ඇති සෑම ප්‍රශ්නයක් ම ව්‍යුහගත ආකාරයට සකස් කොට ඇත. එහි I, II, හා III යන අනුකොටස් සඳහා පිළිවෙළින් ලකුණු 04, ලකුණු 05, ලකුණු 06, බැගින් එක් ප්‍රශ්නයක් සඳහා මුළු ලකුණු සංඛ්‍යාව 15 කි.

A හා B යන කොටස්වල එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ප්‍රශ්න 04 කට මුළු ලකුණු 60 කි. (15 x4 = 60)

I කොටස හා II කොටසේ A හා B යන කොටස් දෙකෙන් තෝරාගත් ප්‍රශ්න 04 සඳහා මුළු ලකුණු සංඛ්‍යාව 40 + 60 = 100 කි.

## ලකුණු දීමේ පටිපාටිය
## II පත්‍රයේ අභිමතාර්ථ

නියමිත නිර්දිෂ්ට නාට්‍ය පෙළ අධ්‍යයනය පිළිබඳ අවබෝධය පරීක්ෂා කර බැලීම දේශීය නාට්‍ය කලාව හා විදේශීය නාට්‍ය කලාව පිළිබඳ දැනුම අවබෝධය සමග විශ්ලේෂණ හැකියාව මැන බැලීමත් මෙම ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථ වේ.

මෙම ප්‍රශ්න පත්‍රය I කොටස හා II කොටස යනුවෙන් කොටස් දෙකකින් යුක්ත ය.

**II පත්‍රය ලකුණු බෙදීයාම**

I කොටස - බහුවරණ ප්‍රශ්න 40 කි. වඩාත් නිවැරදි පිළිතුරට එක් ලකුණ බැගින් මුළු ලකුණු 40 කි.

II කොටස - A හා B යනුවෙන් කොටස් දෙකකි. එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයා තිබීම අපේක්ෂිත ය. සෑම ප්‍රශ්නයක් ම ව්‍යුහගත ආකාරයට සකස් කොට ඇත.

- එක් ප්‍රශ්නයකට අදාළ නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු 15 කි.
- පිළිතුරු සඳහා හිමිවන මුළු ලකුණු 15 x 4 = 60

I කොටස හා II කොටසේ A හා B යන කොටස්වලින් ප්‍රශ්න 02 බැගින් II පත්‍රය සඳහා මුළු ලකුණු 40 + 60 = 100 කි.



WWW.PASTPAPERS.WIKI

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ..................................................
..................................................
.................................................. √ △ $\frac{4}{5}$

(ii) ..................................................
..................................................
.................................................. √ △ $\frac{3}{5}$

(iii) ..................................................
..................................................
.................................................. √ △ $\frac{3}{5}$

03 (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

## බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***



WWW.PASTPAPERS.WIKI

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

නාට්‍ය හා රංග කලාව - සිංහල I
நாடகமும் அரங்கியலும் - சிங்களம் I
Drama and Theatre - Sinhala I

57 S I

2019.08.16 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**විභාග අංකය :** ....................................

| I කොටස | |
|---|---|
| මුළු ලකුණු | 40 |

**උපදෙස්:**

※ I කොටස – **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා, II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

※ II කොටස – A හා B කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

● නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

**1.** වාචික අභිනය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) වාචික අභිනයෙන් තොර ප්‍රාසංගික කලාවක් පැවැතිය නොහැකි ය.
(2) වාචික අභිනයට අයත් වන්නේ සංවාද පමණි.
(3) ජනාන්තික, අපවාරිත හා ප්‍රකාශ භාෂණ ආදි භාෂණ විධි වාචිකාභිනයට අයත් නො වේ.
(4) නාට්‍යධර්මී සම්ප්‍රදායේ දර්ශන, පසුතල ආදිය මවාපාන්නේ වාචික අභිනයෙනි.
(5) ලෝකධර්මී සම්ප්‍රදායේ වාචිකාභිනයට වැදගත් තැනක් හිමි නො වේ. (.........)

**2.** නෘත්තයට අදාළ **නොවන** වරණය වන්නේ,
(1) අංගචලන ය. (2) වේෂභූෂණ ය.
(3) වාද්‍ය වෘන්දය ය. (4) රංගභූමිය ය.
(5) සාත්ත්වික අභිනය ය. (.........)

**3.** සංස්කෘත නාට්‍ය කලාවේ නාට්‍ය ප්‍රභේද සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) අභිඥානශාකුන්තලය ප්‍රකරණ නම් ප්‍රභේදයට අයත් ය.
(2) නාටිකාව දශරූපක ප්‍රභේද අතර ප්‍රධාන තැනක් ගනී.
(3) ලිඛිත පිටපතක් රහිත ප්‍රභේද 'රූපක' යනුවෙන් හැඳින්වේ.
(4) නාටක ප්‍රභේදයට 'ප්‍රවේශක' හා 'විෂ්කම්භක' ඇතුළත් නො වේ.
(5) සංස්කෘත නාට්‍ය ප්‍රභේද 'දශරූපක' යන පොදු නාමයෙන් හැඳින්වේ. (.........)

**4.** සංස්කෘත නාට්‍යයක කක්ෂ්‍යා භාවිතයට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) සංස්කෘත නාට්‍යයේ කක්ෂ්‍යා වෙන් කරනු ලැබුවේ මනඃකල්පිත ව ය.
(2) කක්ෂ්‍යා වෙන් කිරීමට සිදු වූයේ පසුතල නිර්මාණ යොදාගැනීම පහසු වනු පිණිස ය.
(3) එක් කක්ෂ්‍යාවක සිටින පිරිස අනෙක් කක්ෂ්‍යාවේ සිටින පිරිස සමග සංවාදයේ යෙදේ.
(4) කක්ෂ්‍යා වෙන් කොට ඇත්තේ නාට්‍යෝපකරණ භාවිතයෙනි.
(5) අභිඥානශාකුන්තලයේ කක්ෂ්‍යා විභාගය අනුගමනය නො කෙරේ. (.........)

- පහත සඳහන් මාතෘකා අධ්‍යයනය කොට අංක 5 - 9 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A - පාර්සි | F - බොරලැස්ස | K - විධුර |
| B - රති | G - පුෂ්පපුට | L - ක්‍රෝධ |
| C - ත්‍රිපතාක | H - හාස්‍ය | M - ජාකොමේ ගොන්සාල්වේස් |
| D - චොක්රි | I - පච්චමීරා | N - සන්දංශ |
| E - පේසාලේ | J - ඉන්ද්‍රසභා | O - හේවාහැට |

**5.** භරතමුනිගේ රස සූත්‍රයට අදාළ වන්නේ,
(1) A, G හා K ය. (2) B, G හා K ය. (3) B, H හා L ය. (4) C, H හා L ය. (5) D, G හා L ය. (.........)

**6.** සංස්කෘත නාට්‍යයේ සඳහන් 'හස්ත' සඳහා භාවිත නාම වන්නේ,
(1) B, H හා N ය. (2) B, J හා K ය. (3) C, G හා L (4) C, G හා N ය. (5) C,H හා L ය. ය. (.........)

**7.** නූර්ති හා සම්බන්ධ වන්නේ,
(1) A, F හා K ය. (2) A, J හා K ය. (3) B, J හා L ය. (4) D, F හා M ය. (5) E, J හා M ය. (.........)

**8.** සොකරි ගැමි නාටකය හා සම්බන්ධ වන්නේ,
(1) A, J හා K ය. (2) D, F හා O ය. (3) D, I හා K ය. (4) D, I හා O ය. (5) E, I හා M ය. (.........)

**9.** ලංකාවේ පාස්කු නාට්‍ය හා සම්බන්ධ වන්නේ,
(1) A, J හා M ය. (2) D, H හා K ය. (3) E, F හා M ය. (4) E, F හා O ය. (5) E, J හා M ය. (.........)

**10.** ශ්‍රී ලංකාවේ පාස්කු නාට්‍යයට අදාළ **වැරදි** ප්‍රකාශ තෝරන්න.
(1) 1839 දී දූවේ පාස්කු නාට්‍යය රඟ දැක්වීම සඳහා ක්‍රිස්තු ප්‍රතිමාව ගෙන එන ලද්දේ කොචින් දේශයෙනි.
(2) 1939 දූවේ පාස්කු රඟ දක්වන ලද්දේ ගරු මර්සලීන් ජයකොඩි පියතුමා ගේ පිටපතට අනුව ය.
(3) පාස්කු නාට්‍ය ආරම්භ වූයේ පේසාලේ, යාපනය, දූව ආදි ප්‍රදේශවල ය.
(4) ජේසුතුමා ගේ මරණය නූල් සූත්තර මගින් නිරූපණය කෙරිණි.
(5) පාස්කු නාට්‍ය සම්ප්‍රදාය වර්තමානයේ අභාවයට ගොස් ඇත. (.........)

- ප්‍රශ්න අංක 11 සිට 17 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා කරුණු/සංකල්ප/නාම පහ බැගින් දී ඇත. ඒ අතර සෙසු පද හා **නොගැළපෙන** පදය බැගින් තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

**11.** (1) විහාර අස්න (2) තල්පත (3) නාගසේන
(4) දේව දූතයා (5) සති පිරිත (.........)

**12.** (1) හත්පාලවක (2) සෝලියගුරු (3) අලවි රට
(4) ගඳභ (5) සාතාගිර (.........)

**13.** (1) සංබපාල (2) දිව්දොස් (3) රාහු අසුරේන්ද්‍ර
(4) වීරමුණ්ඩ (5) හත් කෝරළය (.........)

**14.** (1) දහඅට පාළි තොරණ (2) දෙකොණ විලක්කුව (3) පිල්ලු වීදිය
(4) මල් මඩුව (5) බෙන්තර (.........)

**15.** (1) මහමෙර (2) නවමල්පාය (3) කපුයක්කාරිය
(4) මුදුන්මාල (5) මැණික්පාල (.........)

**16.** (1) විෂ්ණු (2) සූනියම් යක්ෂිණිය (3) ඔඩ්ඩිස
(4) වඩිග පටුන (5) වැල් වළලු තින්දුව (.........)

**17.** (1) වඩමෝඩි (2) තෙන්මෝඩි (3) කළරි
(4) මකිඩි (5) වසන්තන්කුත්තු (.........)

**18.** දහඅටසන්නි යාගය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) කවි ගායනා ඇත්තේ සීමිත සංඛ්‍යාවකි.
(2) මෙහි උපත් කථාවට බෞද්ධාගමික සබඳතාවක් නැත.
(3) දහඅටසන්නිය පවත්වන ගුරුකුල දෙකක් ඇත.
(4) සියලු ම සන්නි චරිත සඳහා වෙස්මුහුණු පැළඳීමක් සිදු නො වේ.
(5) මහාකෝල සන්නි යක්ෂයා රංගභූමියට නො පැමිණේ. (.........)



WWW.PASTPAPERS.WIKI

**19.** ශ්‍රී ලංකාවේ මඩු ශාන්තිකර්ම සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මඩු ශාන්තිකර්මවල දෙවියන්, යකුන් හා ග්‍රහයෝ පුද ලබති.
(2) ප්‍රධාන වශයෙන් පූජාවට පාත්‍ර වන්නේ නාථ දේවයා ය.
(3) ගම්මඩුවක් පැවැත්වීමේ මූලික අරමුණ කොඩිවිනවලින් ආරක්ෂා වීමයි.
(4) මඩු ශාන්තිකර්ම බහුල ව දක්නට ලැබෙන්නේ දකුණු පළාතේ ය.
(5) පූනාවකට වස්දොස් එක් කොට ගව හිසක ගසා බිඳීම පූනා මඩුවක දී සිදු වේ. (.........)

**20.** සොකරි ගැමි නාටකයේ කථා ප්‍රවෘත්තිය හා සමාන කථා පුවතක් අන්තර්ගත දෙමළ ජන නාටකය තෝරන්න.
(1) වඩමෝඩි (2) තෙන්මෝඩි
(3) කාත්තවරායන්කූත්තු (4) මකිඩි
(5) විලාසම් (.........)

**21.** කෝලම් නාටක පිළිබඳ ශාස්ත්‍රීය ග්‍රන්ථයක් වන "කෝලම් නාටක සාහිත්‍යය" රචනා කළේ,
(1) එදිරිවීර සරච්චන්ද්‍ර ය. (2) තිස්ස කාරියවසම් ය.
(3) එම්.එච්. ගුණතිලක ය. (4) ගණනාථ ඔබේසේකර ය.
(5) නන්දදේව විජේසේකර ය. (.........)

**22.** "ගුමු නාදේ දෙන බඹරගෙ දොසිනා - කරදර විය බෝ සේ" ගීතය ඇතුළත් නූර්තිය,
(1) දුටුගැමුණු ය. (2) ශ්‍රී වික්‍රම ය. (3) නාගානන්ද ය.
(4) උත්තරරාමචරිතය ය. (5) සකුන්තලා ය. (.........)

**23.** ටීටර් නාට්‍ය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) බටහිර රටවල නාට්‍ය සිංහලයට නගා නිෂ්පාදනය කරන ලදී.
(2) ජාතිකානුරාගය හා දේශීයත්වය පිටු දැක ඇත.
(3) අතුරු කථා භාවිත කළේ නැත.
(4) යථාර්ථවාදයෙන් ඔබ්බට ගිය කලු-සුදු චරිත ඇතුළත් ව ඇත.
(5) නාඩගම් හා නූර්ති අනුකරණය කර ඇත. (.........)

**24.** 'මිනර්වා' නාට්‍ය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ශ්‍රේටා ජැනට් ද සිල්වා සහ රුක්මණී දේවී මිනර්වා නාට්‍යවල රඟපෑවා ය.
(2) චිත්‍රපට කලාව මිනර්වා නාට්‍යයේ ජනප්‍රියත්වයට හේතු විය.
(3) පීඩිත පන්තියේ ජීවන රටාව විවරණය වන කථා පුවත් අළලා රචනා විය.
(4) දේශීය ජන සංගීතය භාවිත විය.
(5) 'වැනීසියේ වෙළෙන්දා' මිනර්වා වේදිකාවේ නිෂ්පාදනය වූ නාට්‍යයකි. (.........)

**25.** කොළඹ විශ්වවිද්‍යාලය කොලීජියට අයත් ලංකා විශ්වවිද්‍යාලයීය නාට්‍ය සංගමයේ පුරෝගාමියා කවරෙක් ද?
(1) නියුමාන් ජුබාල් (2) ඇෂ්ලි හල්පේ
(3) ඊ.එෆ්.සී. ලුඩොවයික් (4) සී.ඩබ්. අමරසිංහ
(5) එදිරිවීර සරච්චන්ද්‍ර (.........)

**26.** "ආරම්බෙන් කළ නිර්මිත මනුලොව - ආදිත්‍ය යුරු නිර්මලියේ සොඳ" නම් කිතුනු ගීතය ඇසුරෙන් මනමේ නාට්‍යය සඳහා සරච්චන්ද්‍ර රචනා කළ ගීතය තෝරන්න.
(1) රුසිරු ළඳුනි ඔබ ප්‍රේමයෙනා (2) ප්‍රේමයෙන් මන රංජිත වේ
(3) නන් සිරින් වොරැඳි (4) මෑ වේ මා දුටු
(5) දුලා නෙතු පුලා (.........)

**27.** විශ්වනාත් ලෞජි විසින් සංගීත අධ්‍යක්ෂණය කරන ලද නූර්තිය වන්නේ,
(1) ස්වර්ණතිලකා ය. (2) පද්මාවතී ය.
(3) සිරිසඟබෝ ය. (4) පණ්ඩුකාභය ය.
(5) කුසජාතක කාව්‍යය ය. (.........)

**28.** පහත සඳහන් පාරිභාෂික පද අතුරෙන් කබුකි රඟ හලකට අදාළ **නොවන** පදය තෝරන්න.
(1) හනමිචි (2) සෙරි අගෙ (3) කකිවරි
(4) කුමදොරි (5) මවරි බුතයි (.........)

**29.** කබුකි නාට්‍යයක ස්ත්‍රී චරිත සඳහා අදාළ **නොවන** පදය තෝරන්න.
(1) තයූ (2) අකුබ (3) වක ඔන්නගත
(4) මුසුමෙගත (5) ඔතොකොගත (.........)

**30.** පහත සඳහන් නාට්‍ය අතුරෙන් කබුකි නාට්‍යයක් **නොවන්නේ** කුමක් ද?
(1) ෂිබරකු (2) බුසු (3) සුකෙරොකු
(4) නරුකමි (5) කන්ජින්චෝ (.........)

**31.** එදිරිවීර සරච්චන්ද්‍රයන් ගේ නාට්‍ය නිර්මාණ සම්බන්ධ **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) දේශීය තොවිල් සම්ප්‍රදාය සිය නාට්‍ය සඳහා පාදක කොටගත්තේ නැත.
(2) 'කදාවළලු' නාඩගම් සම්ප්‍රදායෙන් බැහැර ව කළ නාට්‍යයකි.
(3) 'ලෝමහංස' බෞද්ධ ජාතක කථාවක් පාදක කොටගත් නාටකයකි.
(4) 'වෙස්සන්තර' ගීතාංග නාටකයකි.
(5) වෙල්ලවැහුම්, මහාසාර හා බවකඩතුරාව සරච්චන්ද්‍ර ගේ නිර්මාණයන් වේ. (.........)

**32.** පහත සඳහන් නාට්‍ය අතුරෙන් සුගතපාල ද සිල්වා ගේ නාට්‍යයක් **නොවන්නේ** කුමක් ද?
(1) මනරංජන වැඩ වර්ජන (2) බොඩිංකාරයෝ
(3) දූන්න දූනුගමුවේ (4) හරිම බඩු හයක්
(5) හිත හොඳ අම්මණ්ඩි (.........)

**33.** එස්. විද්‍යානන්දන් ගේ නාට්‍ය කලාව සම්බන්ධ **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) සාම්ප්‍රදායික කූත්තු ගී උචිත පරිදි භාවිත කළේ ය.
(2) රාවණේසන් ඔහු ගේ ප්‍රථම පරිවර්තන නාට්‍යයයි.
(3) රාවණේසන් නාට්‍යයට සීතා ගේ චරිතය ඇතුළත් ව නැත.
(4) කාන්තා චරිත කාන්තාවන් විසින් ම රඟපාන ලදී.
(5) සාම්ප්‍රදායික පිටපතකින් බැහැර ව කළ පර්යේෂණාත්මක නිර්මාණයකි. (.........)

**34.** ලංකා සුබෝධවිලාස සභා නාට්‍ය කණ්ඩායම සමග එක් ව ස්වාභාවික නාට්‍ය සම්ප්‍රදායක් බිහි කළ නාට්‍යකරු වන්නේ,
(1) පෞර්ණලිංගම් ය. (2) එස්. විද්‍යානන්දන් ය. (3) එස්. මෞනගුරු ය.
(4) එම්. ෂන්මුගලිංගම් ය. (5) කේ. කනපතිපිල්ලේ ය. (.........)

**35.** "සංකරම්" නමැති නාටකය රචනා කොට නිෂ්පාදනය කළේ
(1) එස්. විද්‍යානන්දන් ය. (2) එස් මෞනගුරු ය.
(3) කුලන්දෙයි ශන්මුගලිංගම් ය. (4) කේ. කනපතිපිල්ලේ ය.
(5) කේ. සිවතම්බි ය. (.........)

**36.** "බමරෝ නව මල් පැණියේ ලොබ වූ ......"
අභිඥානශාකුන්තලයේ එන ඉහත සඳහන් ගීය කවරකු විසින් ගයන ලද්දේ ද?
(1) මාඪව්‍ය (2) රජු (3) ප්‍රියංවදා (4) හංසපදිකා (5) සකුන්තලා (.........)

**37.** අභිඥානශාකුන්තලයේ විදූෂක සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) දුෂ්‍යන්ත පෙනීසිටින සෑම අංකයක ම පෙනීසිටී.
(2) හැඳින්වෙන්නේ "මෛත්‍රේය" යන නාමයෙනි.
(3) දෙවන අංකය අවසානයේ ඔහු හස්තිනාපුරය බලා යන්නේ බලවත් නොකැමැත්තෙනි.
(4) කාලිදාස ගේ සෙසු නාට්‍යවලට වඩා විශාලතම කාර්යභාරය ඉටු කරයි.
(5) දෙවන අංකය ආරම්භයේ දී පෙනීසිටින්නේ කලකිරුණු ස්වභාවයෙනි. (.........)

**38.** සකුන්තලා හස්තිනාපුරය බලා පිටත් වීමට සූදානම් වන අවස්ථාවේ ඇට ආභරණ ලැබුණේ,
(1) කාශ්‍යපතුමා ගෙන් ය. (2) වනස්පතීන් ගෙන් ය. (3) මේනකා ගෙන් ය.
(4) ගෞතමී ගෙන් ය. (5) අනසූයා ගෙන් ය. (.........)

**39.** "ගලින් ගල ගටාලා - අන්ධකාරේ අතීතේ, ගිනිපුපුරු මැවූ ඒ ......"
කුවේණි නාට්‍යයේ එන ඉහත ගීතය ගයන්නේ කවරෙක් ද?
(1) ගායකයෝ (2) පූරක (3) දඩයක්කරු
(4) ජීවහත්ත (5) දිසාලා (.........)

**40.** කුවේණි නාට්‍ය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) නාට්‍යධර්මී ශෛලියට ලියැවී ඇත.
(2) කුවේණිය පිළිබඳ සාම්ප්‍රදායික අදහස් පෝෂණය කරයි.
(3) නාට්‍යධර්මී මෙන් ම ලෝකධර්මී ලක්ෂණ ද අන්තර්ගත ය.
(4) කුවේණියට ප්‍රබල චරිත නිරූපණයක් ලැබී නැත.
(5) රංගෝපකරණ කිසිවක් භාවිත නො වේ. (.........)


WWW.PASTPAPERS.WIKI

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

**අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2019**

**නව නිර්දේශය/ புதிய பாடத்திட்டம்**

| විෂය අංකය<br>பாட இலக்கம் | 57 | විෂයය<br>பாடம் | නාට්‍ය හා රංග කලාව |
|---|---|---|---|

**ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்**
**I පත්‍රය/பத்திரம் I**

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 3 | 21. | 3 | 31. | 1 |
| 02. | 5 | 12. | 2 | 22. | 5 | 32. | 1 |
| 03. | 5 | 13. | 1 | 23. | 4 | 33. | 2 |
| 04. | 1 | 14. | 4 | 24. | 1 | 34. | 1 |
| 05. | 3 | 15. | 5 | 25. | 3 | 35. | 2 |
| 06. | 4 | 16. | 2 | 26. | 2 | 36. | 4 |
| 07. | 2 | 17. | 3 | 27. | 3 | 37. | 5 |
| 08. | 4 | 18. | 4 | 28. | 4 | 38. | 2 |
| 09. | 3 | 19. | 1 | 29. | 5 | 39. | 1 |
| 10. | 5 | 20. | 4 | 30. | 2 | 40. | 3 |

✪ **විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :**

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 40 = 40

## A කොටස

1. (i) කුවේණී වේදිකා නාට්‍යයට මූලාශ්‍රය වූ පුරාවෘත්තය අන්තර්ගත ඓතිහාසික කෘති **දෙකක්** නම් කරන්න.

- මහාවංසය
- කුවේණි අස්න
- රාජාවලිය
- සිහබා අස්න
- දීපවංසය
- වංසත්ථප්පකාසිනී

***ඉහත සඳහන් ඓතිහාසික කෘති අතරින් 2 ක් ලියා ඇත්නම්***
***(ලකුණු 02 යි)***

(ii) නාට්‍ය රචකයා " කුවේණිය සදාකාලික ගැහැනිය" වශයෙන් හඳුන්වා ඇත්තේ මන්ද? පැහැදිලි කරන්න.

ස්වාමි පුරුෂයා විසින් වෙනත් විවාහයක් කරගැනීම පිණිස නිවසින් පන්නාදමනු ලැබීම, දරුවන් සමග මහමගට බැසීමට සිදුවීම, ඥාති මිත්‍රාදීන් ගේ අවමානයට පාත්‍රවීම, අධිකරණයක දී සාධාරණය ඉෂ්ට වීමට නීතියෙන් පවතින බාධා, ගැහැණිය දෙස බලන සාම්ප්‍රදායික ආකල්ප ආදී කරුණු සලකා කුවේණිය මුහුණ පෑ ගැටලු ගැහැණියට මුහුණ පාන්නට වන සදාකාලික ගැටලු ලෙස සලකා වසර 2500 ඉතිහාසයේ එහි කිසිදු වෙනසක් සිදුව නැති බව කියාපෑමට කුවේණිය සදාකාලික ගැහැණිය වශයෙන් හඳුන්වා දීම නාට්‍යකරුවගේ අභිප්‍රාය වී ඇත. "සදා ඇය අප හා සිටින්නී" කවි පෙළින් නාට්‍යයේ අරමුණු අර්ථ ගැන්වේ.

***ඉහත කරුණු විවරණය වන පරිදි තර්කානුකූල ව ගොඩනගා ඇති කරුණු අනුව ලකුණු ලබාදෙන්න.***
***(ලකුණු 06 යි)***

(iii) නාට්‍යයේ එන නූතන කුවේණිය අධිකරණයෙන් ඉල්ලා සිටින්නේ කුමක් ද යන්නත්, නඩුකාරයා ඊට දෙන පිළිතුරත් පිළිබඳ ව සාකච්ඡාවක් ගොඩනගන්න.

කුවේණිය අධිකරණයෙන් ඉල්ලන්නේ යැපුම් මාර්ගයක් නොව තමාට සැමියගෙන් අහිමි වීගිය සෙනෙහස යි.

42 - පිටුව නීතිඥයා ඇගේ අදහස කියයි.

"සමාවුව මැන ස්වාමිනේ මට
යැපීමක් නැත ඇය යදින්නේ ....."

නඩුකාරයා පවසන්නේ ඇය විවාපත් කරගන්න ලෙස ඔහුට අණ කළ හැකි වුව ද ඇයට සෙනෙහස දෙන්නට යයි අණ කළ නොහැකි බව යි.

43 - පිටුව - "ළඳුනි මෙය - සියුමැලි වූ වරයකි
කුමක් කිව යුතුදැ යි නොදන්නෙමි"

මෙහි දී නඩුකාරයා පෙන්වාදෙන්නේ නීතියෙන් ඇය විවාහපත් කරගැනීමට යැ යි අණ කළ හැකි වුව ද ඔහු ගේ සෙනෙහස ලබාදෙන ලෙස අණ කළ නොහැකි බව යි.

සෙනෙහසක් සිසිලසක් නැති ඔහු හිමි කරගෙන ලබාගත හැකි සැනසුම කුමක් ද යන්නත් ප්‍රශ්න කරනු ලබයි.

***ඉහත සඳහන් අදහස් ඇතුළත් වන සේ තර්කානුකූල පිළිතුරක් ගොඩනැගීම අපේක්ෂා කැරේ.***
***(ලකුණු 07 යි)***



WWW.PASTPAPERS.WIKI

**2.** (i) සංස්කෘත නාට්‍යයක කථා වස්තුවේ ප්‍රධාන කොටස් **දෙක** නම් කරන්න.

අධිකාරික හා ප්‍රාසංගික

***(ලකුණු 02 යි)***

(ii) ඊට අදාළ අර්ථප්‍රකෘති නම් කරන්න.

අර්ථප්‍රකෘති පසෙකි. එනම් බීජ, බින්දු, පතාකා ප්‍රකරි හා කාර්ය යනු ය.

ප්‍රධාන චරිත සහභාගි වන දර්ශන අධිකාරික කොටසට ද, අවශේෂ පාත්‍රයන් ගේ කාර්යභාරය අඩංගු දර්ශන ප්‍රාසංගික කොටසට ද අයත් වේ.

ඒ අතුරින් බීජ, බින්දු හා කාර්ය ආධිකාරික කොටසට ද පතාකා හා ප්‍රකරි ප්‍රාසංගික කොටසට ද අයත් වේ.

***(ලකුණු 05 යි)***

(iii) අභිඥානශාකුන්තලය ආශ්‍රයෙන් අර්ථප්‍රකෘති **හතරක්** විවරණය කරන්න.

අභිඥානශාකුන්තලයේ අන්තර්ගත බීජ, බින්දු, පතාකා, ප්‍රකරි හා කාර්ය පහත දැක්වෙන පරිදි විස්තර කළ හැකි ය.

බීජ - බීජ යනු නාට්‍යය කෙසේ අවසාන වේ ද යනු මුලින් ම හඟවන ඉඟිය ය. මෙහි ප්‍රථම අංකයේ තවුසන් ගේ ඉල්ලීම පරිදි සිය අවිය ආපසු ඇදගත් දුෂ්‍යන්ත කෙරෙහි පැහැදුණු ඔවුන් "පුරුවංශයේ උපන් ඔබ ගේ මෙම ක්‍රියාව ඊට ම ගැළපෙනවා. එහෙයින් ඔබ මෙන් ම ගුණ යහපත්, මතු සක්විති රජකු වන්නා වූ පුත් රුවනක් ඔබට ලැබේවා!" යි කළ ප්‍රකාශය මෙම නාට්‍යයේ බීජය යි. එය මල්පල ගැන්වී රජුට සිය පුතු හමු වීම අවසාන 7 වැනි අංකයේ නිරූපණය වේ.

බින්දු - ශකුන්තලා හමුවීමෙන් ඇය කෙරෙහි පෙමින් වෙළුණු දුෂ්‍යන්ත හට ආපසු හස්තිනා පුරයට යාමට සිදුවීම ගැටුමකි. එය නිරාකරණය වන්නේ, මිත්‍ර කණ්ව කුලපති අසපුවේ නොමැති හෙයින්, තවුසන් ගේ ආරක්ෂාව පිණිස ඔහු වනයේ ම නතර වීමට තීරණය කිරීමෙනි. එය බින්දු අවස්ථාවක් හැටියට සැලකිය හැකි ය. යළි දෙවන අංකය අවසානයේ සිය පියා ගේ දානය සඳහා නගරයට එන ලෙස මවු බිසව ගෙන් කෙරෙන ඉල්ලීම ගැටුම් අවස්ථාවකි. එය නිරාකරණය වන්නේ තමන් වෙනුවට විදූෂක හස්තිනාපුරයට යැවීමට දුෂ්‍යන්ත තීරණය කිරීමෙනි. එය ද බින්දු අවස්ථාවකි. වෙනත් බින්දු අවස්ථාවන් ද ලියා තිබිය හැකි ය.

පතාකා - අභිඥානශාකුන්තලයේ ශාකුන්තලා ගේ යෙහෙළියන් දෙදෙනා වන අනසූයා හා ප්‍රියංවදා ගේ කාර්යභාරය මුලසිට සිවුවැනි අංකයේ මැද දක්වා ම විහිදෙන හෙයින් එය පතාකා නම් අර්ථප්‍රකෘතිය ලෙස හැඳින්විය හැක. ඔවුන් දෙදෙනා නිතර ම උත්සාහ කරන්නේ දුෂ්‍යන්ත හා සකුන්තලා ගේ ප්‍රේම සම්බන්ධයට උදව් කිරීමට ය. එය පතාකාවක් වන්නේ එබැවිනි.

ප්‍රකරි - මීට හොඳ ම උදාහරණය නම් 6 වැනි අංකයේ මුල ප්‍රවේශකයේ නිරූපණය වන ධීවරයා පිළිබඳ වෘත්තාන්තය යි. ඔහු අත තුබූ, තමා ශකුන්තලාට දී තුබූ පේරුස් මුදුව දුටු විගස ඔහුගේ ඇසට කඳුළු ඉණු බව පැවසේ. එය දුටු වහා ම රජුට ශකුන්තලා නැවත මතක් වීම නිසා ය. එය එක් සිද්ධියකට පමණක් සීමා වීම නිසා එය ප්‍රකරි අර්ථප්‍රකෘතියක් ලෙස හැඳින්විය හැකි ය.

කාර්ය - නාට්‍යයේ දුෂ්‍යන්ත හා ශකුන්තලා පෙනීසිටින සෑම දර්ශනයක් අයත් වන්නේ කාර්යයට යි. දෙදෙනා මුල් අංක තුනේ ම තමන්ගේ සම්බන්ධය වර්ධනය කරගෙන ශකුන්තලා ගැබ්ගැනීමෙන් අවසන් වේ. අවසාන අංකයේ දී දුෂ්‍යන්ත හට යළිත් සිය පුතු හා සකුන්තලා හමුවීමෙන් නාට්‍යය අවසන් වේ. ඒ සියලු සිද්ධි අයත් වන්නේ කාර්ය නම් අර්ථප්‍රකෘතියට යි. ***(ලකුණු 08 යි)***

**3.** (i) අභිඥානශාකුන්තලය හා කුවේණි නාට්‍ය දෙකෙහි රචකයන් ගැන ඉතා කෙටි හැඳින්වීමක් කරන්න.

අභිඥාන ශාකුන්තලය - මහාකවි කාලිදාස

සංස්කෘත කවීන් අතර අග්‍රගණ්‍ය කවියා වෙයි. වික්‍රමෝර්වශීය, මාලවිකාග්නිමිත්‍ර ඔහු ගේ සෙසු නාට්‍ය රචනා වෙයි. මේ අතරින් ශාකුන්තලය සංස්කෘත නාට්‍ය සාහිත්‍යයෙහි ශ්‍රේෂ්ඨතම කෘතිය යි. ඔහු ගේ අනෙක් නිර්මාණ අතර කුමාරසම්භව හා රඝුවංශය ඍතුසංහාරය හා මේඝදූතය ද වේ.

කුවේණි නාට්‍ය - හෙන්රි ජයසේන

1950 දශකයේ දී නාට්‍යකරණයට පිවිසි හෙතෙම නාට්‍ය රචකයකු, නාට්‍ය පරිවර්තකයකු, නිරූපණ ශිල්පියකු හා නාට්‍ය අධ්‍යක්ෂවරයකු ලෙස විවිධ අංශයන්හි දක්ෂතා පෙන්නුම් කර ඇත. මුල් ම යුගයේ පරිවර්තන නාට්‍ය නිෂ්පාදනය කළ අතර, පසු ව අනුවර්තන හා ස්වතන්ත්‍ර නාට්‍ය නිෂ්පාදනයේ යෙදුණි. බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ගේ රංග රීතිය මෙරට සිංහල වේදිකාවට හඳුන්වා දීමට මූලික වූයේ හෙන්රි ජයසේන මහතා ය. ඒ අනුව ඔහු විසින් හුණුවටයේ කථාව, දිරිය මව සහ ඇගේ දරුවෝ යන නාට්‍ය නිෂ්පාදනය කරන ලදි. කුවේණි, ජනේලය, මනරංජන, වැඩවර්ජන, අපට පුතේ මගක් නැතේ, තවත් උදෑසනක් යනා දි ස්වතන්ත්‍ර නාට්‍ය රැසක් ද ඔහු ගේ නිර්මාණ අතර වේ. ***(ලකුණු 04 යි)***

(ii) ස්ත්‍රිය පිළිබඳ රචකයන් දෙදෙනා ගේ දෘෂ්ටිකෝණ පැහැදිලි කරන්න.

මහාකවි කාලිදාස - කාලිදාස කාන්තාව විනීත හා සාධු ගුණයෙන් යුතු චරිතයක් ලෙස ඉදිරිපත් කරන අතර ඒ තුළ මූලික වශයෙන් ම ප්‍රකාශ වන්නේ සාම්ප්‍රදායික කාන්තාව යි. පුරුෂාධිපත්‍ය චින්තනයට නතුව සියල්ල දෛවයට ඉඩ දී කටයුතු කළ යුතු බව දැක්වේ. එමෙන් ම ධෛර්ය සම්පන්නව ජීවිතයට මුහුණ දෙන කාන්තාව පිළිබඳ ව අදහසක් ද ඇති වේ. ස්වාමිපුරුෂයා තමා ප්‍රතික්ෂේප කළ ද ඔහු වෙනුනේ පතිව්‍රතාව රැකගත් පරමාදර්ශී හින්දු පතිනියක් ඇයගෙන් නිරූපණය වේ.

හෙන්රි ජයසේන - කාන්තාව යනු පුරුෂ මූලික සමාජයේ නිරන්තර දුක් පීඩාවන්ට ලක්වන්නියක ලෙස දක්වන අතර අතීතයේ සිට වර්තමානය දක්වා ම එහි වෙනසක් නොමැති බව පෙන්වා දෙයි. කාන්තාවන්ට අවමන් කිරීම බැහැර කරන ඔහු මෙම නාට්‍ය මගින් කාන්තාව දෙස සංවේදී ලෙස බැලීමට ප්‍රේක්ෂකයා යොමු කිරීමට උත්සාහ දරයි.

මෙවැනි ආකාරයේ අදහස් ප්‍රකාශ කර ඇති විට ලකුණු ලබාදිය හැකි ය. **(මෙහිදී චරිත දෙකෙහි ලක්ෂණ ප්‍රකාශ කිරීම අදාළ නො වේ.)** ***(ලකුණු 05 යි)***



WWW.PASTPAPERS.WIKI

(iii) තමන් මුහුණ දුන් ගැටුම්කාරී අවස්ථාවට සකුන්තලා හා නූතන කුවේණිය මුහුණ දුන් ආකාරය පිළිබඳ ඔබේ ආකල්පය පැහැදිලි කරන්න.

ශකුන්තලා සහ නූතන කුවේණිය මුහුණ දුන් අවස්ථා පිළිබඳ ව අපේක්ෂකයා දක්වා ඇති අදහස තර්කානුකූල ව ඉදිරිපත් කිරීම පිළිබඳ ව සලකා බලා ලකුණු ප්‍රදානය කරන්න.

***(ලකුණු 06 යි)***

**B කොටස**

4. (i) කෝලම් නාටකයෙහි එන ස්ථාවර පාත්‍ර **හතරක්** නම් කරන්න.

- කාරියකරවන රාළ හෙවත් සබේවිදානේ
- අණබෙර කෝලම
- හේවා කෝලම
- පොලිස් කෝලම
- ආරච්චි කෝලම
- ජස කෝලම හෙවත් ජේඩ්රාළ
- ලෙන්චිනා
- මුදලි කෝලම

***පාත්‍ර වර්ග 4ක් නම් කිරීම සඳහා (ලකුණු 04 යි)***

(ii) ඉහත (i) හි දක්වන ලද පාත්‍ර **දෙකක්** විස්තර කරන්න.

**අණබෙර කෝලම**

**(මේ චරිත පිළිබඳ ව කෙටි විස්තරයක් අපේක්ෂිත ය.)**

පණික්කලේ නමින් ද හැඳින්වෙන මොහු රජයේ නිවේදන ප්‍රකාශයට පත්කරන්නා වේ. වයසක පුද්ගලයකු වන මොහු දවුලක් කරලාගෙන බීමත් ව පැමිණෙයි. කෝලම් රැඟුම් බැලීමට රජු සහ බිසව පැමිණෙන බව දැන්වීම සඳහා ඔහු පැමිණ ඇත. ඔහු ගේ බිරිඳ වන නොංචි අක්කා පැමිණීමෙන් පසු හාස්‍යජනක අවස්ථාවක් නිර්මාණය වේ.

මේ ආකාරයට එම චරිතයට අදාළ ව වේෂභූෂණ සංවාද ආදිය පිළිබඳ ව ලියා පැහැදිලි කර ඇත්නම් සම්පූර්ණ ලකුණු දෙන්න.

***චරිත දෙකක් සඳහා 2 x 2 = (ලකුණු 04යි)***


(iii) කෝලම් නාටකයෙහි රංග ශෛලිය විස්තර කරන්න.

1. නාට්‍ය ධර්මී රංග ශෛලියට අයත් වීම.
2. නළුවන් වෙස් මුහුණු පැළඳීම
3. කෝලම් නාටකවල දී කාරියකරවනරාළ විසින් මෙන් ම පාත්‍රයා විසින් ම තමා හඳුන්වා දීම.
4. නිශ්චිත රංග ආකෘතියක් පැවතීම.
5. අවස්ථා නිරූපණය සඳහා කවි ගායනා සහ නර්තන යොදාගැනීම.
6. ගද්‍ය සහ පද්‍ය සංවාද භාවිත කිරීම.
7. පූර්වරංගය සහ අපරරංගය යනුවෙන් කොටස් දෙකක් තිබීම.
8. කෝලම් නාටක ආරම්භ වීමට පෙර පණිවිඩ කෝලම් නමින් හැඳින්වෙන එකිනෙකට සම්බන්ධ නැති චරිත කිහිපයක් පැමිණීම.
9. සියලු චරිත පිරිමින් විසින් පමණක් රඟපානු ලැබීම.
10. විවිධ චරිත වර්ග (මානුෂ, අධිමානුෂ, සත්ත්ව) ඇතුළත් වීම.
11. එළිමහන් කවාකාර රංග භූමියක් භාවිත කිරීම.
12. පහතරට බෙරය, තාලම්පට, හොරණෑව වාද්‍ය භාණ්ඩ ලෙස භාවිතා කිරීම.

***ඉහත සඳහන් කරුණු පහක් විස්තර කර ඇත්නම් (ලකුණු 07 යි)***

**5.** (i) නාඩගමෙහි රංගභූමිය රූප සටහනකින් විස්තර කරන්න.

- මඩුව
- තිරය
- උස්කොට තනාගත් රංග භූමිය (කරළිය)
- කොප්පරා පහන්



*රංග භූමිය ඇඳ නම් කර තිබීම (ලකුණු 04 යි)*

(ii) නාඩගමෙහි ප්‍රභවය කෙටියෙන් පැහැදිලි කරන්න.

නාඩගම් ප්‍රභවය පිළිබඳ මත කිහිපයක් පවතී. ඉන් කිහිපයක් මෙසේ ය.

1. දකුණු ඉන්දීය තෙරුක්කූත්තු නම් වීදි නාටක ආභාසයෙන් ප්‍රභවය ලැබූ බව.
2. යුරෝපීය ජන වන්දනා නාටක ආශ්‍රයෙන් ප්‍රභවය ලැබූ බව.
3. දේශීය කවි නාටකවල ආභාසයෙන් ප්‍රභවය ලැබූ බව.
4. උඩරට රජවරුන් ආවාහ විවාහ කටයුතු වෙනුවෙන් දකුණු ඉන්දීය කුමාරිකාවන් ගෙන්වූ අතර ඒ සමග ආ අනෙක් ශිල්ප ශ්‍රේණීන් අතර නාඩගම් කරුවන් ද සිටි බව.

*මෙවැනි කරුණු කෙටියෙන් පැහැදිලි කර ඇත්නම්, (ලකුණු 05 යි)*

(iii) ගැමි නාටක ආකෘතියෙන් ඔබ්බට ගිය ලක්ෂණ නාඩගමෙහි අන්තර්ගත ව ඇතැයි ඔබ සිතන්නහු ද? ඔබේ පිළිතුර කරුණු මගින් තහවුරු කරන්න.

- නිශ්චිත පෙළ සාහිත්‍යයක් සහිත වීම.
- නිශ්චිත රංග භූමියක් තිබීම.
- නාට්‍යෝචිත ගී තනු හා සංවාද භාවිතය.
- ආනුෂංගික අංග වර්ධනීය ආකාරයෙන් භාවිතය.
- බටහිර ඔපෙරා හා චීන නාටකවල ආභාසය ගැනීම.
- අවශේෂ ගැමි නාටකවලට වඩා අංගසම්පූර්ණ දෘශ්‍ය කාව්‍යයක් වීම.

*මෙවැනි කරුණු හතරක් තර්කානුකූල ව ලියා ඇත්නම්, (ලකුණු 06 යි)*



WWW.PASTPAPERS.WIKI

6. (i) එදිරිවීර සරච්චන්ද්‍රයන් ගේ නාට්‍ය නිර්මාණ **හතරක්** නම් කරන්න.

මනමේ (1956), රත්තරං (1958), කදාවළලු (1958), එළොව ගිහින් මෙලොව ආවා (1959), වෙල්ල වැහුම් (1960), හස්ති කාන්ත මන්තරේ (1960), සිංහබාහු (1961), ලෝමහංස (1968), මහාසාර (1968), වෙස්සන්තර ගීතාංග නාටකය (1980), ඒකට මට හිනා හිනා, බව කඩතුරාව (1989)

***නාට්‍ය හතරක් නම්කර ඇත්නම් (ලකුණු 04 යි)***

(ii) ඉහත (i) හි සඳහන් කරන ලද නිර්මාණ **දෙකක්** ගැන විස්තරයක් කරන්න.

නාට්‍ය රචනයේ මූලාශ්‍රය (ජාතක කථා, මහාවංසය, ජනකථා) නාට්‍ය ප්‍රවර්ගය හෝ සම්ප්‍රදාය (නාඩගම් / හාස්‍යෝත්පාදක) නාට්‍ය ශෛලිය, කථාපුවත කෙටියෙන්, පාත්‍ර වර්ගයා සහ එම චරිත රඟපෑ නළු-නිළියන් පිළිබඳ විස්තර, සංවාද රචිත විලාසය (ගද්‍ය / පද්‍ය / ගීත) නිර්මාණයේ විශේෂ ලක්ෂණ වැනි කරුණු යටතේ නාට්‍ය නිර්මාණ දෙකක් ගැන කෙරෙන විස්තරය සඳහා

***(ලකුණු 04 යි)***

(iii) එදිරිවීර සරච්චන්ද්‍රයන් ශ්‍රී ලාංකේය නාට්‍ය කලාවේ අභිවෘද්ධියට කළ ශාස්ත්‍රීය සේවාව අගයන්න.

- ශ්‍රී ලංකාවේ ශාන්තිකර්ම හා දේශීය ගැමි නාටක පිළිබඳ ව කළ පර්යේෂණ ඇසුරින් නව නාට්‍ය නිර්මාණය කිරීම.
- නාට්‍ය රචකයකු වශයෙන් පරිවර්තන / අනුවර්තන / ස්වතන්ත්‍ර කෘති රචනා කිරීම.
- නිෂ්පාදකවරයකු වශයෙන් උසස් කලාත්මක නාට්‍ය නිර්මාණය කිරීම.
- ලේඛකයෙකු වශයෙන් නාට්‍ය සාහිත්‍යය පෝෂණය කිරීමට කෘති හා ලිපි ලේඛන රචනා කිරීම. (වෙස් මුහුණුද සැබෑ මුහුණුද, නාට්‍ය ගවේෂණ, කල්පනා ලෝකය, සාහිත්‍ය විද්‍යාව)
- නාට්‍ය විචාරකයකු වශයෙන්
- නාට්‍ය කලාව පිළිබඳ ආචාර්යවරයකු, දේශකවරයකු හෝ උපදේශකවරයකු වශයෙන්
- නාට්‍ය හා රංග කලා උසස් පෙළ විෂය නිර්දේශය පළමුවරට සකස් කළ සම්පාදකවරයකු වශයෙන් ද ශ්‍රී ලාංකේය නාට්‍ය කලාවේ අභිවෘද්ධියට කළ ශාස්ත්‍රීය සේවාව ඇගයීම වෙනුවෙන්

***(ලකුණු 07 යි)***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

නාට්‍ය හා රංග කලාව - සිංහල II
நாடகமும் அரங்கியலும் - சிங்களம் II
Drama and Theatre - Sinhala II

57 S II

2019.08.17 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

විභාග අංකය : ......................................

| I කොටස | |
|---|---|
| මුළු ලකුණු | 40 |

**උපදෙස්:**

* **I** කොටස – **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා, **II** කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
* **II** කොටස – **A** හා **B** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

* එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියෙන් ඇති **වරහන තුළ** ලියන්න.

**1.** ප්‍රාකෘතික කලාවට අදාළ නිවැරදි පිළිතුර තෝරන්න.
(1) ලාලිත්‍යයෙන් හා සුබනම්‍ය බවින් යුතු ය.
(2) ප්‍රේක්ෂක විඥානය පුළුල් කරයි.
(3) මටසිලිටි බවින් යුතු වේ.
(4) අභිචාරාත්මක අරුතකින් යුතු ය.
(5) මිනිස් චෛතසිකය සමග ආත්මීය වේ. (.........)

**2.** ජන කලාවක් ලෙස හැඳින්විය **නොහැක්කේ** මින් කුමක් ද?
(1) සොකරි (2) කුත්තු (3) කෝලම් (4) නූර්ති (5) ලී කෙළි (.........)

**3.** බැලේ සහ ඔපෙරා යන සම්ප්‍රදාය දෙකට පොදු නිවැරදි පිළිතුර තෝරන්න.
(1) එක හා සමාන ශිල්ප ධර්ම පද්ධතියක් අනුගමනය කෙරේ.
(2) දෙපයේ ඇඟිලි තුඩු මත සමබරතාව රඳවාගනිමින් රංගනයේ යෙදේ.
(3) යුරෝපා රටවල ප්‍රභවය විය.
(4) සංගීතයට විශේෂ ස්ථානයක් නො ලැබේ.
(5) චයිකොව්ස්කි බැලේ මෙන් ම ඔපෙරා සඳහා ද සංගීතය රචනා කළේ ය. (.........)

**4.** ප්‍රොසීනියම් වේදිකාවේ ගැඹුර මවා පෙන්වීමට මහත් සේ උපකාරී වන තිරය කුමක් ද?
(1) ප්‍රධාන තිරය (2) පැති තිරය
(3) ගගනිකාව (4) උඩු තිරය
(5) මැද තිරය (.........)

**5.** පුළුල් කෝණයකින් ආලෝක ධාරාවක් පතිත කිරීමට උපයෝගී කරගනු ලබන පහන් වර්ගය කුමක් ද?
(1) වර්ණ චක්‍රය (2) යොමු පහන
(3) පාරජම්බුල පහන (4) ස්ට්‍රෝබ් පහන
(5) ධාරාලෝක පහන (.........)



WWW.PASTPAPERS.WIKI

6. අවස්ථා ප්‍රතිනිර්මාණ සඳහා නළු-නිළියන්ට හා අධ්‍යක්ෂවරයාට වැඩි අවබෝධයක් ලැබෙන්නේ,
(1) රංග වින්‍යාසකරු ගේ කාර්යභාරය හේතුවෙනි.
(2) වේදිකා පරිපාලක ගේ තීක්ෂ්ණ ඥානයෙනි.
(3) අංග රචනා ශිල්පියා ගේ සහයෝගයෙනි.
(4) පෙළ රචකයා සපයා ඇති රංග විධාන මගිනි.
(5) රංගාලෝක ශිල්පියා ගේ පරිශ්‍රමයෙනි. (………)

7. නාට්‍ය අධ්‍යක්ෂවරයකු ගේ සාර්ථකත්වය මැනීම සඳහා උපයෝගී කොටගැනීමට උචිත නිර්ණායකය තෝරන්න.
(1) උපරිම ප්‍රේක්ෂක සහභාගිත්වයක් ලබාගැනීම උදෙසා සිය කාලය හා ශ්‍රමය කැප කිරීමයි.
(2) ජනප්‍රිය නළු-නිළියන් තෝරාගෙන තිබීමයි.
(3) උපරිම තාක්ෂණයක් භාවිත කිරීමයි.
(4) ආනුෂංගික අංග පිළිබඳ ව මනා දැනුම ප්‍රදර්ශනය කිරීමයි.
(5) මූලිකාංග හා ආනුෂංගික අංග මනා ලෙස හසුරුවමින් ප්‍රබල අරුතක් ප්‍රකාශ කිරීමයි. (………)

8. 'රංගපරම' සංගීතය යන්නට අදාළ නිවැරදි වරණය තෝරන්න.
(1) යටිපෙළ අරුත් ගන්වන සංගීතයයි. (2) නාට්‍යයේ බාහිර ආටෝපය රඳවාගනියි.
(3) මතුපිට අරුත තීව්‍ර කරයි. (4) පසුබිම් සංගීතය හා සමාන වෙයි.
(5) රංගනය අබිබවා ඉස්මතු වේ. (………)

9. ඇරිස්ටෝටල් ගේ කාව්‍යශාස්ත්‍රයේ ඇති පරිච්ඡේද ගණන කීය ද?
(1) 23 (2) 24 (3) 25 (4) 26 (5) 27 (………)

10. අනුකරණය පිළිබඳ ඇරිස්ටෝටල් ගේ මතවාදයට අදාළ නිවැරදි පිළිතුර තෝරන්න.
(1) කවියකු සතු ව අනුකරණ මාධ්‍ය විධි පහක් ඇත.
(2) ශෝකෝත්පාදකය යනු උත්තුංග ක්‍රියාවක අනුකරණයකි.
(3) ශෝකෝත්පාදකයේ දී ප්‍රකෘති තත්ත්වයට වඩා පහත් මිනිසුන් අනුකරණය කෙරේ.
(4) ප්‍රකෘති තත්ත්වයට වඩා උසස් මිනිසුන් අනුකරණය කෙරෙනුයේ හාස්‍යෝත්පාදකයේ දී ය.
(5) අනුකරණ මාධ්‍ය විධි පිළිබඳ කාව්‍ය ශාස්ත්‍රයේ සඳහන් නො වේ. (………)

11. ග්‍රීක නාට්‍යකරුවකු **නොවන්නේ,**
(1) තෙස්පිස් ය. (2) ප්‍රටිනස් ය.
(3) පෙයිසිස්ට්‍රාටොස් ය. (4) ඛොයිරිලොස් ය.
(5) ෆ්රූනිඛොස් ය. (………)

12. සමකාලීන මාතෘකාවක් අළලා ඊස්කිලස් විසින් රචිත ශෝකෝත්පාදකය වන්නේ,
(1) අර්ජීනිහු ය. (2) පාරසිකයෝ ය. (3) බක්ඛයි ය.
(4) අයියස් ය. (5) ඛොයිෆොරොයි ය. (………)

13. ඩිතුරම්බොස් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) අපොලෝ දෙවියන් උදෙසා කළ භක්ති ගායනයයි.
(2) ඩිතුරම්බොස් ගායන වෘන්දය එළුවන්ගේ වෙස්ගෙන සිටියහ.
(3) ඩිතුරම්බොස් යනු දියොනීසස් ගේ අපර නාමයකි.
(4) ඩිතුරම්බොස් ගාන වෘන්දය වෙස්මුහුණු පැළැඳසිටියේ නැත.
(5) තෙස්පිස් ඩිතුරම්බොස් ගාන වෘන්දයට සහභාගි නො විණි. (………)

14. දැනට ශේෂ වී ඇති 'සටුර' නාට්‍යයක් වන්නේ,
(1) කුක්ලොප්ස් ය. (2) ඉක්නෙව්ටායි ය. (3) අයියස් ය.
(4) එක්ලීසියාසොව්සායි ය. (5) අල්කීස්ටිස් ය. (………)

15. ග්‍රීක නාට්‍ය රචක සොෆොක්ලීස් සම්බන්ධ **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) ඇතැන්සයේ නාට්‍ය තරගවලින් ප්‍රථම ස්ථාන 24ක් ලබා ඇත.
(2) සටුර නාටක 30ක් රචනා කොට ඇත.
(3) නාට්‍ය 125ක් පමණ රචනා කොට ඇත.
(4) ත්‍රෛරූපක රචනා කොට නැත.
(5) පශ්චාද්දෘෂ්ටිකථනය ඔහු ගේ නාට්‍යෝපක්‍රමයකි. (………)


**16.** යථාර්ථවාදයේ පියා ලෙස විචාරකයන් හඳුන්වන ග්‍රීක නාට්‍යකරු කවරෙක් ද?
(1) ඇරිස්ටොෆනීස් (2) මෙනැන්ඩ්‍රොස් (3) සොෆොක්ලීස්
(4) ඊස්කිලස් (5) යුරිපිඩීස් (.........)

**17.** ග්‍රීක කොමෝඩි සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ගාන වෘන්දය 24 දෙනකුගෙන් සමන්විත ය.
(2) වේෂභූෂණ ග්‍රීක ශෝකෝත්පාදකය හා සමාන විය.
(3) කොමඩියේ පරමාර්ථය වූයේ උත්තුංග ක්‍රියා අනුකරණයයි.
(4) කාව්‍යශාස්ත්‍රයේ වැඩි අවධානයක් යොමු ව ඇත්තේ සුඛෝත්පාදකයටයි.
(5) කොමඩියේ දී නළුවන් වෙස්මුහුණු පැළැන්දේ නැත. (.........)

**18.** ක්‍රි.ව. 311 දී රෝම නාට්‍ය තහනම් කරන ලද්දේ කවුරුන් විසින් ද?
(1) සාන්ත නිකුලස්තුමා (2) ටර්ටුලියන් පියතුමා
(3) IVවන හෙන්රි රජු (4) කොන්ස්ටන්ටයින් රජු
(5) අර්බන් පාප්වරයා (.........)

**19.** පොදු මිනිසාට යහපත් උපදේශයක් ලබා දෙන මධ්‍යකාලීන නාට්‍ය ප්‍රභේදය වන්නේ,
(1) මොරැලිටි ය. (2) මිරැකල් ය. (3) මිස්ටරි ය.
(4) කෝපුස් ක්‍රිස්ටි ය. (5) අර්බන් පාප්වරයා ය. (.........)

**20.**



ඉහත ඡායාරූපයෙන් දැක්වෙන්නේ,
(1) බූත් වේදිකාව ය. (2) මන්දිර වේදිකාව ය.
(3) බහු වේදිකාව ය. (4) ජංගම රථ වේදිකාව ය.
(5) දෙව්මැදුර අභ්‍යන්තර වේදිකාව ය. (.........)

**21.** මධ්‍යකාලීන යුරෝපයේ චක්‍ර නාටක සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) චක්‍ර නාටක සඳහා වෙළඳ ශ්‍රේණිවල සහභාගිත්වයක් නො වී ය.
(2) දෙව්මැදුරු අභ්‍යන්තරයේ රඟ දැක්විණි.
(3) කිසිදු ආනුෂංගිකාංගයක් භාවිත නො කැරිණි.
(4) පූජකවරු රඟපෑමෙන් දායක වූහ.
(5) යෝක් චක්‍රයට නාටකමාලා හතළිස් අටක් අයත් විය. (.........)

- අංක **22 - 24** තෙක් ප්‍රශ්නවලට අදාළ ව සපයා ඇති නම් අතර සෙසු නාම හා **නොගැළපෙන** නාමය තෝරා, එහි අංකය වරහන තුළ ලියන්න.

**22.** (1) තෝමස් කිඩ් (2) ශියොන් අනියු (3) රොබට් ග්‍රීන්
(4) බෙන් ජොන්සන් (5) විලියම් ශේක්ස්පියර් (.........)

**23.** (1) රෝමියෝ ජුලියට් (2) කොරියෝලේනස් (3) ටේමිං ඔෆ් ද ශ්‍රෑ
(4) කිං ලියර් (5) ඔතෙලෝ (.........)

**24.** (1) සැවෝයි (2) ෆෝචූන් (3) ග්ලෝබ්
(4) ස්වෝන් (5) රෝස් (.........)

**25.** "දුෂ්ටයෝ, තොපි ඇනපු කිනිසි සීසර්ගෙ ශරීරෙ ඇතුළෙ දි එකට ගැටෙන හඬ ඇහෙන තුරුම, තොපි ඒ වගෙ අනතුරු ඇඟවීමක් කළේ නැහැ"
ජුලියස් සීසර් නාට්‍යයේ එන ඉහත සංවාදය කවරකු විසින් කියන ලද්දක් ද?
(1) ඔක්ටේවියස් (2) ඇන්ටනි (3) ලෙපිඩස් (4) ක්ලෝඩියස් (5) සින්නා (.........)


WWW.PASTPAPERS.WIKI

- 4 -

**26.** ජූලියස් සීසර් නාට්‍යයේ සීසර් දුටු සිහිනය කුමන්ත්‍රණකරුවන්ට වාසිදායක වන ලෙස අර්ථකථනය කරන්නේ කවරෙක් ද?
(1) කස්කා (2) සින්නා (3) මෙටලස් සිම්බර්
(4) ඩෙසියස් බ්‍රූටස් (5) කැසියස් (.........)

**27.** ජූලියස් සීසර් නාට්‍යයේ කැල්ෆර්නියා "හිඟන්නන් මැරෙනකොට වල්ගාතරු පායන්නේ නෑ"යි පවසන්නේ මන්ද?
(1) දෙවියන් අනතුරු හඟවන්නේ උත්තුංග පුද්ගලයින් ගේ ව්‍යසනයක දී බැවිනි.
(2) සීසර්ට අධිරජ පදවිය ලැබීමට නියමිත ව ඇති බව පැවසීමට බැවිනි.
(3) ඇය වල්ගා තරු පායා තිබෙනු සිහිනයෙන් දුටු බැවිනි.
(4) සීසර් අදෘශ්‍යමාන බලවේග විශ්වාස නොකරන බැවිනි.
(5) වල්ගා තරු අවාසනාවේ හා මරණයේ සංකේතයක් ලෙස සලකන්නේ ප්‍රභූන් විසින් පමණක් බැවිනි. (.........)

**28.** ජූලියස් සීසර් තමන් ධ්‍රැව තාරකාවට සමාන කරගන්නේ මන් ද?
(1) පොම්පේ පරාජය කොට ඔහු ගේ දරුවන් ද මරාදැමූ හෙයිනි.
(2) තමාට අභියෝග කිරීමට හැකි වෙනත් නායකයකු රෝමයේ නොමැති බැවිනි.
(3) ඔහු ඩික්ටේටර් (ස්වෛරීපාලක) පදවිය දරාසිටි හෙයිනි.
(4) එය උත්තරධ්‍රැවයට සමීප ව පිහිටි තාරකාව බැවිනි.
(5) තමා ගත් තීරණයක් කිසි විටෙක වෙනස් නොකරන හෙයිනි. (.........)

**29.** යුරෝපයේ යථාර්ථවාදී නාට්‍ය කලාවක් බිහිවීමට බලපෑ නිවැරදි හේතුව තෝරන්න.
(1) ත්‍රිමාණ පසුතල භාවිතයෙන් මනා ප්‍රේක්ෂාවක් මැවීමට අවශ්‍ය වීම
(2) පරිණාමවාදය, හේතුඵලවාදය, සමානාත්මතාව වැනි සාධක කෙරෙහි අවධානය යොමු වීම
(3) කතෝලික ධර්මයට ප්‍රමුඛත්වයක් හිමි වීම
(4) වැඩවසම් සමාජ ක්‍රමයේ නැගීම හා පන්ති ක්‍රමයේ බිඳවැටීම
(5) කාර්මික දියුණුව හේතුවෙන් සමාජය යළි අතීතය අගයන්නට වීම (.........)

**30.** "පුහ් ඃ එනවා මාව බය කරන්න! මම එච්චර මෝඩ නැහැ. නමුත් ......? නැහැ, නමුත්...... ඒක එහෙම වෙන්න බැහැ! මම එහෙම කෙරුවෙ ආදරය වෙනුවෙන්"
රූකඩ ගෙදර නාට්‍යයේ එන ඉහත සංවාද ඛණ්ඩය කවුරුන් විසින් පවසන ලද්දක් ද?
(1) ලින්ඩෙ (2) රන්ක් (3) නූවුරා (4) හෙල්මර් (5) කෘෘග්ස්ටඩ් (.........)

**31.** රූකඩ ගෙදර නාට්‍යයේ නෝරා සිය තරන්තලා නැටුම සඳහා අතට ගන්නා වාද්‍ය භාණ්ඩය කුමක් ද?
(1) අත් රබාන (2) සීනුව (3) ඩොලැක්කිය (4) තැම්බුරීනය (5) අත් බෙරය (.........)

**32.** තරන්තලා නර්තනය රූකඩ ගෙදර නාට්‍යයට එක් කොට ඇත්තේ මන්ද?
(1) නාට්‍යයේ ප්‍රාසංගික බව තිව්‍ර කිරීමට
(2) විලාසිතා සාදයට එම නර්තනය ඉදිරිපත් කරන ලෙස ලැබුණු ඉල්ලීමට
(3) නූවුරා ගේ ආතතිය දුරු කිරීමට
(4) හෙල්ම ගේ ආකර්ෂණය ලබාගැනීමට
(5) හෙල්ම කෘෘග්ස්ටඩ් ගේ ලිපිය ගැනීම ප්‍රමාද කිරීමට (.........)

**33.** රූකඩ ගෙදර නාට්‍යයේ ප්‍රබලතම සංකේතය කුමක් ද?
(1) තරන්තලා නර්තනය (2) නත්තල් ගස
(3) තරන්තලා ඇඳුම (4) මැකරූන්
(5) කුරුසිය ලකුණු කළ කලු කාඩ්පත් (.........)

**34.** ආඛ්‍යාන (එපික්) රංග රීතියේ පුරෝගාමී නාට්‍යකරු වන්නේ,
(1) මොරිස් මේටර්ලින්ක් ය. (2) ඔගස්ට් ස්ට්‍රින්බර්ග් ය.
(3) අර්වින් පිස්කැටෝර් ය. (4) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ය.
(5) වෝල්ටර් හේසන්ක්ලෙවර් ය. (.........)

**35.** පහත සඳහන් නාට්‍යකරුවන් අතර අසම්මත නාට්‍ය රචකයකු **නොවන්නේ**

(1) ඉයුජින් අයනෙස්කෝ ය.
(2) ආතර් මිලර් ය.
(3) සැමුවෙල් බෙකට් ය.
(4) ආතර් ඇඩමොව් ය.
(5) හැරල්ඩ් පින්ටර් ය. (.........)

- පහත සඳහන් කරුණු/සංකල්ප/නාම පදනම් කොට අංක **36** - **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - ඩොක්ටර් ෆවුස්ටස්
B - ද බුචර්ස්
C - ආලෙලූයියා
D - සංකේතවාදය
E - පුන්තිලා
F - ප්‍රකාශනවාදය
G - ටැම්බලේන්
H - තෙරේස් රැක්වින්
I - ගැලීලියෝ
J - වෙස්ටර් චක්‍රය
K - සකලජන
L - ආඛ්‍යාන රංගය
M - මෝල්ටාවේ යුදව්වා
N - පැන්ස තුනේ කථාව
O - එමිලි සෝලා

**36.** යුරෝපයේ මධ්‍යකාලීන නාට්‍ය කලාවට අදාළ වන්නේ,
(1) A, J හා M ය. (2) B, G හා K ය. (3) C, J හා K ය. (4) C, K හා N ය. (5) E, G හා K ය. (.........)

**37.** එළිසබෙතීන යුගයට අදාළ වන්නේ,
(1) A, C හා J ය. (2) A, G හා M ය. (3) A, I හා N ය. (4) B, H හා N ය. (5) C, G හා M ය. (.........)

**38.** ස්වාභාවිකවාදී නාට්‍ය රීතියට අදාළ වන්නේ,
(1) B, H හා O ය. (2) B, I හා O ය. (3) C, I හා O ය. (4) E, G හා I ය. (5) E, G හා N ය. (.........)

**39.** පොදුවේ නාට්‍ය රීතිවලට අදාළ වන්නේ,
(1) B, G හා N ය. (2) D, F හා H ය. (3) D, F හා L ය. (4) D, L හා M ය. (5) E, F හා L ය. (.........)

**40.** බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගේ නාට්‍ය **තුනක්** වන්නේ,
(1) B, E හා G ය. (2) E, G හා M ය. (3) E, G හා N ය. (4) E, I හා N ය. (5) G, K හා M ය. (.........)

* *



WWW.PASTPAPERS.WIKI

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2019

## නව නිර්දේශය/ புதிய பாடத்திட்டம்

| විෂය අංකය<br>பாட இலக்கம் | 57 | විෂයය<br>பாடம் | නාට්‍ය හා රංග කලාව II |
|---|---|---|---|

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 3 | 21. | 5 | 31. | 4 |
| 02. | 4 | 12. | 2 | 22. | 2 | 32. | 3 |
| 03. | 3 | 13. | 3 | 23. | 3 | 33. | 1 |
| 04. | 3 | 14. | 1 | 24. | 1 | 34. | 3 |
| 05. | 2 | 15. | 4 | 25. | 2 | 35. | 2 |
| 06. | 4 | 16. | 5 | 26. | 4 | 36. | 3 |
| 07. | 5 | 17. | 1 | 27. | 5 | 37. | 2 |
| 08. | 1 | 18. | 4 | 28. | 5 | 38. | 1 |
| 09. | 4 | 19. | 1 | 29. | 2 | 39. | 3 |
| 10. | 2 | 20. | 4 | 30. | 3 | 40. | 4 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 40 = 40

## A - දේශීය නාට්‍ය කලාව

1. (i) ඊඩිපස් රජ නාට්‍යය හැරුණු විට සොෆොක්ලීස් විසින් රචනා කරන ලද වෙනත් නාට්‍ය **හතරක්** නම් කරන්න.

කොලෝනස් හි ඊඩිපස් (Oedipus at Colonus)

ඇන්ටිගනී (Antigone)

ඇජැක්ස් (Ajax)

විමන් ඔෆ් ට්‍රකීස් (Trachiniae)

ඉලෙක්ට්‍රා (Electra)

ෆිලොක්ටීටීස් (Philoctetes)

ඉක්නෙවිටායි (Icneutai)

***(ලකුණු 04 යි)***

(ii) තීබ නගරයට උදා වී ඇති විපත ඊඩිපස් රජ නාට්‍යයේ පූර්වරංගයෙන් විස්තර වන්නේ කෙසේ ද?

- බෝග ඵලයෙන් පිරුණු මහ පොළව වියළී ඇත.
- තැනින් තැන මරණයට පත් වූවෝ වෙති.
- කාන්තාවන් ගේ ගැබ් ගැනීම් අඩුවී ඇති අතර රුදුරු මහා භූතයන් ගෙන් නගරය ම වෙළී ඇත.
- සෑම තැනක ම රෝග බිය, මරණ බිය
- සෑම ගෙදරකින් ම නැගෙන දුක් අඳෝනාවලින් නගරය පිරී ඇත.

***නිවැරදි කරුණු 3 ක් විස්තර කර තිබීම.***

***(ලකුණු 05 යි)***

(iii) ඊඩිපස් නාට්‍යයේ පළමු අංකයේ තීබ දේශය විපතින් ගලවාගන්නා බවට රජු දෙන ප්‍රතිඥාව ඇසුරෙන් ඔහු ගේ චරිත ලක්ෂණ විග්‍රහ කරන්න.

- තම රට වැසියන් ගේ ගැටලු කෙරෙහි වහා ම සංවේදී වේ.
- සත්‍යය හෙළි කරගැනීමට දැඩි සේ උත්සාහ කරයි.
- තම විධානයට ප්‍රතිචාර ප්‍රමාද වන විට ක්ෂණයෙන් කෝපයට පත් වේ.
- නීතිගරුක භාවය ප්‍රදර්ශනය වේ.

***නිවැරදි කරුණු 3 ක් වත් විස්තර කර ඇත්නම්,***

***(ලකුණු 06 යි)***



WWW.PASTPAPERS.WIKI

2. (i) ජුලියස් සීසර් නාට්‍යයේ සීසර් ගේ ඝාතකයන් **සිව් දෙනකු ගේ** නම් සඳහන් කරන්න.

- මාකස් බ්‍රෑටස්
- කේයස් කැසියස්
- කස්කා
- ට්‍රෙබෝනියස්
- ලිගේරියස්
- ඩෙසියස් බ්‍රෑටස්
- මෙටලස් සිම්බර්
- සින්නා

***ඉහත චරිත අතුරින් හතරක් නම් කර ඇත්නම්,***

***(ලකුණු 04 යි)***

(ii) ජුලියස් සීසර් නාට්‍යයේ කූටප්‍රාප්ති අවස්ථා **දෙක** පැහැදිලි කොට දක්වන්න.

- ජුලියස් සීසර් ඝාතනය කරන ලද අවස්ථාව
- මාක් ඇන්ටනි ගේ අවමංගල්‍ය දේශනය

***ඉහත අවස්ථා දෙක පැහැදිලි කර තිබේ නම් ලකුණු 2 ½ x 2 බැගින් ලකුණු 05 ක් හිමිවේ.***

(iii) දෙවන කූටප්‍රාප්ති අවස්ථාවෙන් පසු සීසර් ඝාතනය සැලසුම් කළ කුමන්ත්‍රණකරුවන්ට සිදු වන්නේ කුමක් ද?

- ඇන්ටනි හා බ්‍රෑටස් විසින් රෝම ෆෝරමයේ (Forum) දී සීසර් ගේ දේහය අබියස අවමංගල දේශනා පැවැත්වීමෙන් අනතුරු ව, ඇන්ටනිගේ දේශනය හේතුවෙන් මහජනයා කෝපයට පත්වීම දෙවන කූටප්‍රාප්ති අවස්ථාව යි.
- ඉන් අනතුරු ව කුමන්ත්‍රණය මෙහෙයවූ නායකයන්ට රෝමයෙන් පිට ව යාමට සිදු වේ. රෝමයේ ඉතිරි වන කුමන්ත්‍රණකරුවෝ ඝාතනයට ලක් වෙති.
- පිට ව යන කුමන්ත්‍රණකරුවන් වන බ්‍රෑටස් හා කැසියස් ඇතුළු පිරිසට විවිධ දුෂ්කරතා මැද සිය ප්‍රතිවාදීන් වන ඇන්ටනි හා ඔක්ටේවියස් සමග සටන් කිරීමට සිදු වේ.
- බ්‍රෑටස් හා කැසියස් අතර අමනාපකම් ඇති වීම, සේනා නඩත්තු කිරීම, බ්‍රෑටස්ට සීසර් ගේ අවතාරය දෘශ්‍යමාන වීම ආදි කරුණු හේතුවෙන් ඔවුන් ගේ මානසික තත්ත්වය දුර්වල වී සටනින් පැරදී සියදිවි නසාගැනීමට සිදු වේ.
- ඝාතනය සැලසුම් කළ ද ඝාතනයෙන් පසු කුමක් කළ යුතු ද යන්න ගැන සැලසුමක් නොමැති වීමෙන් කුමන්ත්‍රණකරුවෝ ප්‍රථමයෙන් මානසික වශයෙන් ද දෙවනුව යුද බිමේ දී ද පරාජයට පත් වෙති.

***(ලකුණු 06 යි)***

3. (i) 'රෑකඩ ගෙදර' නාට්‍යයේ රංග විධාන අනුව ආරම්භක දර්ශනයේ වේදිකාව මත තැබිය යුතු නාට්‍යෝපකරණ **හතරක්** නම් කරන්න.

- මේසයක්
- සැප පුටුවක්
- කුඩා සෝෆාවක්
- ගිනි උදුනක්
- පැද්දෙන පුටුවක්
- කුඩා රාක්කය
- පොත් අල්මාරිය

***ඉහත සඳහන් නාට්‍යෝපකරණ 4 ක් සඳහන් කර ඇත්නම් (ලකුණු 04 යි)***

(ii) එම නාට්‍යයේ නුවුරා ටෝවල්ඩ් හෙල්ම ගෙන් වසන් කරගෙන සිටින රහස කුමක් ද යි දක්වා එසේ සඟවා සිටීමට හේතුව කවරේ ද යි පහදන්න.

නෝරා මුදල් ණයට ගැනීම සම්බන්ධ ගිවිසුම් පත්‍රයට තම මියගිය පියා ගේ අත්සන වංචනික ලෙස යෙදීම.

මෙම රහස සඟවා සිටීමට බල පෑ සාධක -

- බිරිඳට ස්වාමියා ගේ අනුමැතියෙන් තොර ව මුදලක් ණයට ගැනීමට නීතියෙන් ඉඩක් නැති වීම.
- හෙල්ම රෝගාතුර ව සිටීම.
- පියා රෝගාතුර ව සිට මියයාම නිසා ඇය පොරොන්දු පත්‍රයට අත්සන් තැබීම.
- තමන් වයස්ගත වූ කල එම රහස අනාවරණය කිරීමෙන් හෙල්මගේ ආදරය දිනාගත හැකි බව සිතාසිටීම.
- හෙල්ම ණය වීම තම ආත්ම අභිමානයට යෝග්‍ය නොවන්නේ ය යන ආකල්පය දැරීම.

***ඉහත සඳහන් අදහස් සනාථ වන කරුණු 03 ක් විස්තර කර තිබේ නම් (ලකුණු 05 යි)***

(iii) රහස අනාවරණය වීමෙන් පසු රෑකඩ ගෙදරට උදා වූ තත්ත්වය සාකච්ඡා කරන්න.

- හෙල්ම නෝරාට තදබල ලෙස දෝෂාරෝපණය කිරීම.
- නෝරා සහ හෙල්ම ගේ කුටුම්බය බිඳවැටීම.
- නෝරා දරුවන් සහ නිවස අතහැර පිට ව යෑම.
- හෙල්ම ගේ ආත්මාභිමානය සුන් වීම.
- නෝරා ස්වකීය නිදහස සොයා යාම.

***ඉහත සඳහන් අදහස් සනාථ වන කරුණු 03 ක් විස්තර කර තිබේ නම් (ලකුණු 06 යි)***


WWW.PASTPAPERS.WIKI

## B - විදේශීය නාට්‍ය කලාව

**4.** (i) ප්‍රාසංගික කලාවේ මූලික නිර්ණායක හඳුන්වන්න.

ශිල්පියා ගේ සිරුර හා කටහඬ, උපයෝගී කරගෙන ප්‍රේක්ෂක සමූහයක් අබියස ඉදිරිපත් කෙරෙන නැටුම් ගැයුම් හා රැඟුම් ආදිය ප්‍රසංගික කලා ගණයට වැටේ.

1. නිශ්චිත ස්ථානයක (වේදිකාව / රංගභූමිය) නිශ්චිත කාලයක් තුළ ප්‍රේක්ෂක පිරිසක් අභිමුඛයෙහි සජීවී අන්දමට ඉදිරිපත් කැරේ.
2. සජීවී කලාවක් නිසා ගතික බවින් හා වෙනස් වන සුළු ගුණයෙන් යුක්ත ය.
3. අභිනය භාවිතය.
4. ශිල්පීය කුශලතාවට ප්‍රමුඛස්ථානයක් හිමිවීම.
5. පංචේන්ද්‍රියන්ට ගෝචර වන අත්දැකීමක් ලෙස ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත.
6. ශිල්පී - ප්‍රේක්ෂක සම්බන්ධය සෘජු ව ම දක්නට ලැබේ.
7. රසාස්වාදය ලබාදීම මූලික අරමුණ වේ.

***මෙවැනි කරුණු හතරක් සඳහන් කර ඇත්නම් (ලකුණු 04 යි)***

(ii) සිනමාව, රූපවාහිනිය හා ප්‍රාසාංගික කලා අතර වෙනස පැහැදිලි කරන්න.

1. සිනමාව හා රූපවාහිනිය සජීවී අත්දැකීමක් නොවන අතර නාට්‍යය සජීවී අත්දැකීමකි.
2. සිනමාව හෝ රූපවාහිනිය සඳහා රූගත කරන අවස්ථාවේ දර්ශනයන් සජීවී වුව ද ප්‍රේක්ෂකයාට දෘශ්‍යමාන වන්නේ තිරයක් මත ය. ප්‍රාසංගික කලාවන්හි දී එසේ නො වේ.
3. සිනමාවට හා රූපවාහිනියට සෘජු ප්‍රේක්ෂක ප්‍රතිචාර නො ලැබේ. ප්‍රාසංගික කලාවේ දී සෘජු ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබේ.
4. චිත්‍රපටිය හා රූපවාහිනිය තාක්ෂණයේ ප්‍රතිඵලයක් වන අතර ප්‍රාසංගික කලා සජීවී ශිල්පීන් ගේ ඉදිරිපත් කිරීම් වේ.
5. සිනමාවේ හා රූපවාහිනියේ ප්‍රධාන මාධ්‍යය කැමරාව වන අතර, ප්‍රාසංගික කලාවේ ප්‍රධාන මාධ්‍යය වන්නේ නළුවා ගේ පෞරුෂය යි.
6. සිනමාව හෝ රූපවාහිනිය නිර්මිත කෘතියක් වන නමුත් ප්‍රාසංගික කලාව සජීවී නිර්මාණ කාර්යයකි.
7. සිනමාව හා රූපවාහිනිය තිරකලාවන් ලෙස සැලකේ. ඒවා ප්‍රේක්ෂකයා නරඹන්නේ තිරයක් මත ප්‍රක්ෂේපණය වීමෙනි. ප්‍රාසංගික කලාව එසේ නො වේ.
8. රූපවාහිනිය හා සිනමාව එක ම රූප එකවර ඕනෑ ම තැනකදී නැරඹිය හැකි අතර ප්‍රාසංගික කලාව නිශ්චිත ස්ථානයකට සීමා වේ.
9. රූපවාහිනිය හා සිනමාව රූපගත කළ පසු දර්ශනය නොවෙනස් වේ. ප්‍රාසංගික කලා නිර්මාණ එළි දැක්වෙන්නේ එම මෙහොතේ දී ය. එහෙයින් දර්ශනවල සුළු සුළු වෙනස් වීම් ඇති වීමට ඉඩ ඇත.
9. රූපවාහිනියේ හෝ සිනමාවේ රූප රාමු අප නරඹන්නේ කැමරාකරුට අවශ්‍ය කෝණයෙනි. එහෙත් ප්‍රාසංගික කලාවේ දී ප්‍රේක්ෂකයා දර්ශන නරඹන්නේ සැබෑ ජීවිතයේ දී ඒවා දර්ශනය වන ආකාරයට ය.

***මෙවැනි කරුණු තුනක් වත් වෙනස ලියා පැහැදිලි කර ඇත්නම් (ලකුණු 05 යි)***

(iii) ප්‍රාසාංගික කලා අතර නාට්‍ය කලාවට හිමි වන ස්ථානය පැහැදිලි කරන්න.

- කතා වස්තුවට වැදගත් ස්ථානයක් හිමි වේ.
- කතා වස්තුව තුළ ගැටුම් මූලික ලක්‍ෂණයක් වේ.
- සතර අභිනය ම භාවිතා වේ.
- සෙසු කලා මාධ්‍යයන් උපයෝගී කරගත හැකි ය.
- අනෙකුත් කලා මාධ්‍යයන් ගෙන් පෝෂණය වන පරායත්ත කලාවකි.
- මිනිස් ජීවිතය වඩාත් පහසුවෙන් විවරණය කළ හැකි ය.
- ඍජු ප්‍රේක්‍ෂක ප්‍රතිචාරයන්ට අනුකූල ව හැඩ ගැසී ඇති නම්‍යශීලී කලාවකි.

***ඉහත සඳහන් කරුණු හතරක්වත් විස්තරාත්මකව දක්වා ඇත්නම් (ලකුණු 06 යි)***

**5.** (i) නිෂ්පාදනය සඳහා නාට්‍ය පෙළක් තෝරාගැනීමේ දී අධ්‍යක්ෂවරුන් සැලකිල්ල යොමු කළ යුතු කරුණු **හතරක්** දක්වන්න.

- වස්තු බීජය නිර්මාණාත්මක ද යන වග.
- රංගෝචිත බව
- ප්‍රබල නාට්‍යෝචිත අවස්ථාවන් ගෙන් යුක්ත ද යන බව.
- නාටක පෙළ ස්වතන්ත්‍ර, පරිවර්තිත හෝ අනුවර්තිත කෘතියක් දැ යි දැනගැනීම.
- ප්‍රේක්‍ෂක රසඥතාව උදෙසා කොතරම් දුරට ඉවහල් වේ ද යන වග.
- එයින් පැවසෙන්නේ කවර ආර්ථික, සමාජමය, දේශපාලන ප්‍රවණතා ද යන බව
- නූතන වේදිකාවේ සාර්ථක වේ ද යන බව.
- නාට්‍යයේ ශෛලිය (නාට්‍යධර්මී / ලෝකධර්මී ආදි වශයෙන්)

***කරුණු 4 ක් තිබේ නම් (ලකුණු 04 යි)***

(ii) පෙළ තෝරාගැනීමෙන් අනතුරු ව නිෂ්පාදන ක්‍රියාවලියට ප්‍රථම ඔහු අවධානය යොමු කළ යුතු කරුණු **පහක්** පැහැදිලි කරන්න.

- පිටපත අවබෝධ කරගැනීම.
- නිෂ්පාදන පිටපත සකස් කරගැනීම.
- නළුවරණය.
- ආනුෂංගික අංග පිළිබඳ ව
- ආනුෂංගික ශිල්පීන් තෝරාගැනීම පිළිබඳ ව
- ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලයෙන් අවසර ලබාගැනීම.
- නාට්‍ය පෙළ හඳුන්වා දීම හා කියැවීම.
- නාට්‍ය පුහුණුව
- සංවේශ පුහුණුව
- මංගල දර්ශනය
- මංගල දර්ශනයෙන් පසු ව නාට්‍යයේ ඉදිරි නාට්‍ය දර්ශන පිළිබඳ ව

***කරුණු 5 ක් තිබේ නම් (ලකුණු 05 යි)***



WWW.PASTPAPERS.WIKI

(iii) සාර්ථක නාට්‍ය අධ්‍යක්ෂවරයකු තුළ තිබිය යුතු ගුණාංග හා ශක්‍යතා කරුණු **තුනක්** යටතේ සාකච්ඡා කරන්න. (ඉහත (ii) ප්‍රශ්නයට දුන් පිළිතුර නැවත විස්තර කිරීම මෙහි ලා නොකළ යුතු ය.)

<u>ගුණාංග හා ශක්‍යතා</u>

බුද්ධිය, ප්‍රතිභාව, පරිකල්පනය, ධෛර්යය, උද්‍යෝගය, ධී ශක්තිය, නිර්මාණශීලී කුශලතාව, උපායශීලිත්වය, ඉවසීම, සංවේදී බව, අවංකභාවය, දයාව, සුහදව වැඩ කිරීමේ හැකියාව.

- නාට්‍යයට දායක වන ආනුෂංගික කලා ශිල්පීන් නාට්‍යයේ අපේක්ෂා කරන අරමුණ සාක්ෂාත් කරගත හැකි පරිදි මෙහෙයැවීමේ හැකියාව.

***ඉහත සඳහන් ගුණාංග සහ ශාක්‍යතා හෝ ඊට අදාළ කරුණු විස්තර කර ඇත්නම්***

***(ලකුණු 06 යි)***

**6.** (i) කෙටි නාට්‍ය පිළිබඳ අර්ථ නිරූපණ **දෙකක්** ඉදිරිපත් කරන්න.

- කෙටි නාට්‍ය යනු බොහෝවිට විනාඩි 30 නොඉක්මවන රංග කාලයකින් යුක්ත අංක එකකින් හෝ එක් ජවනිකාවකින් යුක්ත නාට්‍යයකි. එය දිගු නාට්‍යයක සාරාංශයක් නො වේ.
- කෙටි නාට්‍යයක කතා වස්තුව එක් අංකයක් තුළ දී ආරම්භ වී වර්ධනය කොට සමාප්තියට පත් වේ.
- ජීවිතයේ එක් ඇසිල්ලක් හෝ එක් කෙටි අවස්ථාවක් හෝ චරිතයක අංශු මාත්‍රයක් නාටකීය අයුරින් සියුම් ලෙස නිරූපණය කෙරේ.
- බොහෝ කෙටි නාට්‍ය ත්‍රිවිධ ඒකීයත්වය (කාල ඒකීයත්වය, ස්ථාන ඒකීයත්වය, ක්‍රියා ඒකීයත්වය) අනුගමනය කරමින් නාටකීය අවස්ථාව විසිර යාමට නො දී රඟ දැක්වේ.

***(ලකුණු 04 යි)***

(ii) කෙටි නාට්‍ය පෙළක් රචනා කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු **හතරක්** කෙටියෙන් පැහැදිලි කරන්න.


- අංක එකකට හෝ ජවනිකා එකකට කතා වස්තුව සීමාකර ගැනේ.
- චරිත සංඛ්‍යාව සීමා කරගැනේ.
- අවස්ථා හා සිදුවීම් කීපයකට සීමාකර ගැනේ.
- ආනුෂංගික අංගවලට වඩා පාත්‍ර වර්ගයා ගේ රංගනය ප්‍රබල වන අයුරින් ගැටුම නිරූපණය කිරීමට අවශ්‍ය සංවාද යොදා ගැනේ.
- අනවශ්‍ය එකදු වචනයක් හෝ සංවාදවලට ඇතුළත් නොකැරේ.
- කතා වස්තුවේ ආරම්භය - වර්ධනය - කූටප්‍රාප්තිය අවසානය එක ජවනිකාවකට සීමා කැරේ.
- ගැටුමට මුල පිරීම - ගැටුම උච්ච අවස්ථාවට පත්වීම හා නිරාකරණය කෙටි කාලයක් තුළ අවසන් කිරීම.

***වැනි කරුණු 04 ක් පැහැදිලි කිරීමට (ලකුණු 05 යි)***


(iii) ඔබ කියවා හෝ නරඹා ඇති කෙටි නාට්‍යයක් පිළිබඳ සාකච්ඡාවක් කරන්න.

නරඹා හෝ කියවා ඇති කෙටි නාට්‍යයක තේමාව, චරිත නිරූපණය, රංග ශෛලිය, අන්තර්ගතය හා ආකෘතිය යනාදි කරුණු යටතේ සාකච්ඡා කිරීම වෙනුවෙන්

***(ලකුණු 06 යි)***



වාරෙටම ඕන කරන පොත් එකපාර
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්වා ගන්න
LOL
Book Store
25% OFF
ALL BOOKS
Including Exercise Books,
CR Books, and B5 Books
ඕනෙම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්ටමක්
ORDER BOOKS FROM LOL BOOKS STORE
0372060110
WWW.LOL.LK
071 777 4440 (WhatsApp)
Cash On Delivery Available


ORDER GCE A/L
SHORT NOTES, MODEL,
REVISION BOOKS & PAST
PAPERS IN SINHALA, ENGLISH
& TAMIL MEDIUM
LOL
BOOK
STORE
CASH ON DELIVERY
AND KOKO PAYMENT
AVAILABLE
WHATSAPP - 0717774440
WEBSITE: WWW.LOL.LK
GET READY FOR YOUR A/Ls
WITH LOL BOOK STORE!